(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 6(4).]

# පාර්ලිමේන්තුවේ අංක 6 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2012 ජූලි මස 20 වැනි සිකුරාදා**

## 2012 අගෝස්තු මස 07 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

පරිසර අමාත්‍යතුමා,— වන සංරක්ෂණ අඥාපනත යටතේ නියෝග,— (451 වැනි අධිකාරය වන) වන සංරක්ෂණ ආඥාපනතේ 24 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ජූනි 11 දිනැති අංක 1762/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.07.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2012 අගෝස්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2100/'11

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේදී ආනයනය කරන ලද ඖෂධ හා ශල්‍ය උපකරණ සඳහා වරායට ගෙවූ ප්‍රමාද ගාස්තු ප්‍රමාණය හා ගෙවූ පාර්ශ්වය කවරේද;

(ii) 2006, 2007, 2008 සහ 2010 වර්ෂයන්හිදී ඉහත ආනයනයන්ට අදාළව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ගෙවූ ප්‍රමාද ගාස්තු වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2008 වර්ෂයේදී හඳුනාගත් හානිවූ, කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් බාල ඖෂධවල වටිනාකම කොපමණද;

(ii) එම බාල ඖෂධ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට ඇති මුදල කොපමණද;

(iii) එම මුදල අය කර නොගැනීමට හේතු කවරේද;

(iv) 2008 වර්ෂයේදී මිලදී ගත් ඖෂධ තත්ත්වයෙන් බාල බව අනාවරණය වුවද ටෙන්ඩර් මණ්ඩලය නැවත මිලදී ගැනීමේදී එය නොසලකා හැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඖෂධ සංස්ථාව විසින් සෆියුරොක්ෂිම් සෝඩියම් (Cefuroxime Sodium) මිලිග්‍රෑම් 750 එන්නත් 2,50,000 ක් මිලදී ගැනීමේදී සහ වර්ෂ 2009 දී රසායනාගාර පරීක්ෂාවකින් තොරව වෙළඹපටි මිලදී ගැනීමේදීත්, නියමිත බර නොමැති ඇමොක්සිලින් ප්‍රතිජීවක මිලිග්‍රෑම් 250 කරල් ඒකක 6783ක් මිලදී ගැනීමේදීත් දැරීමට සිදුවූ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2421/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ තැන්පතු සඳහා වාර්ෂිකව ලබාදෙන පොළී ප්‍රතිශතය කොපමණද;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභීන්ට ලැබෙන වෙනත් වරප්‍රසාද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සේවක අර්ථසාධක අරමුදල් මූලස්ථානය සඳහා ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තු කර ඇති වියදමින් කවර ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලින් පියවාගැනීමට අපේක්ෂා කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2422/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 2012 ඔලිම්පික් ක්‍රීඩා උළෙලෙහි එක් එක් ක්‍රීඩා ඉසව්ව සඳහා සහභාගිවන ක්‍රීඩකයන් ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ඉසව්ව සඳහා ක්‍රීඩකයන් තෝරාගනු ලැබූ දිනය කවරේද;

(iii) 2012 ඔලිම්පික් සංචිතය සඳහා නම් කරන ලද මුළු ක්‍රීඩකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ඉසව්ව සඳහා තෝරාගත් ක්‍රීඩකයන්ට පුහුණුකරුවන් සහ පුහුණුවට අනුග්‍රාහකයන් තෝරාගෙන තිබේද;

(v) ක්‍රීඩකයන් හා අනුග්‍රාහකයන් තෝරාගැනීමේ පදනම කුමක්ද;

(vi) 2012 වර්ෂය සඳහා ඔලිම්පික් සංචිතයේ සිටින එක් ක්‍රීඩකයෙක් වෙනුවෙන් වෙන් කිරීමට බලාපොරොත්තුවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2247/'12

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 අප්‍රේල් 01 වැනි දින ස්ථාපිත කරනු ලැබූ බදු අභියාචනා කොමිෂන් සභාවේ නිල කාල සීමාව;

(ii) එම කොමිෂන් සභාව සඳහා පත් කරනු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් නිලධාරියාගේ සම්පූර්ණ නම හා අදාළ සුදුසුකම්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බදු අභියාචනා කොමිෂන් සභාව සඳහා කුලියට ගත් පස් මහල් ගොඩනැගිලි සංකීර්ණය පිහිටි ස්ථානය සහ ඒ සඳහා මාසිකව ගෙවන ලද කුලිය කවරේද;

(ii) එම කොමිෂන් සභාවේ සේවක වැටුප්, ජල සහ විදුලි බිල්පත් ඇතුළු පුනරාවර්තන වියදම් වෙනුවෙන් එහි පළමු මාස හය තුළ වැයවී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ පැවති බදු අභියාචනා ගොනු 120ක් අභිනව බදු අභියාචනා කොමිසම වෙත පැවරූ බවත්;

(ii) එම ගොනු සම්බන්ධ විභාග කිසිවක් අදාළ කාලසීමාව තුළ අවසන් කර නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් රජයට රුපියල් කෝටි 800ක පමණ මුදලක් අහිමිව ගිය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2423/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පාපන්දු සංචිතයට 2011 වර්ෂයේදී තෝරාගනු ලැබූ ක්‍රීඩකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩකයෙකුට ක්‍රීඩා අමාත්‍යාංශය සහ පාපන්දු සම්මේලනය විසින් වෙන්කරනු ලැබූ මුදල කොපමණද;

(iii) බැද්දගානේ පිහිටි ජාතික පාපන්දු පුහුණුකිරීමේ මධ්‍යස්ථානයේ පාපන්දු ක්‍රීඩකයින් පුහුණුව සඳහා වර්ෂයකට වෙන් කරනු ලබන මුදල කොපමණද;

(iv) එම මුදල් සපයා ගනු ලබන මූලාශ්‍ර කවරේද;

(v) මේ වන විට බැද්දගාන පුහුණුකිරීමේ මධ්‍යස්ථානයේ නේවාසිකව හා අර්ධකාලීනව පුහුණුව ලබන ක්‍රීඩකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පිට පළාත්වලින් ජාතික පාපන්දු සංචිතයට තෝරාගනු ලබන ක්‍රීඩකයින්ට ලබා දෙන පහසුකම් කවරේද;

(ii) ජාතික පාපන්දු කණ්ඩායමේ ක්‍රීඩකයින්ට පූර්ණකාලීනව ක්‍රීඩා කිරීමට අවශ්‍ය අනුග්‍රාහකත්වය ලැබෙන්නේද;

(iii) නොඑසේ නම්, එවැනි අනුග්‍රාහකත්වයක් ලබාදීම සඳහා ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2424/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ගොවිජන සේවා සහ වන ජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අවසන්වරට වන අලි සංගණනය සිදුකරන ලද දිනය කවරේද;

(ii) එම සංගණනයට අනුව දැනට සිටින වන අලි සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අභයභූමිවලට අමතරව වන අලි රැඳී සිටින ස්ථාන කවරේද;

(iv) ගම්වදින වන අලි නිසා පීඩාවට පත්වන ජනතාවට සහන සැලසීමට රජය ගනු ලබන ඉදිරි ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1188/'11

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) සමස්ත තිරිඟු පිටි පරිභෝජනය සහ ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලැබූ තිරිඟු පිටි ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේදී තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය කවරේද;

(iv) ආනයනය කරනු ලැබූ තිරිඟු පිටි ප්‍රමාණය කොපමණද;

(v) ආනයනය කරනු ලැබූ තිරිඟු පිටිවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආනයනය කරනු ලබන සහ දේශීයව නිපදවනු ලබන තිරිඟුපිටි කිලෝග්‍රෑම් 1ක් සඳහා පනවා ඇති සියලුම බදු (ඍජු හා වක්‍ර) කවරේද යන්නත් එතුමා වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1642/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ගා/අගුළුගල්ල කණිෂ්ඨ විද්‍යාලය වසා දමා ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් පාසල සතු විශාල භෞතික සම්පත් ප්‍රමාණයක් විනාශ වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාසල නැවත විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම පාසල නැවත විවෘත නොකරන්නේ නම්, එය වෙනත් ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, එම ආර්ථික කටයුත්ත කවරේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1907/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික රූපවාහිනිය සතු ක්‍රීඩා තරග පටිගත කළ කැසට් පට හෝ දෘඪ තැටි කාල්ටන් ක්‍රීඩා නාලිකාව (CSN) වෙත ලබා දීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දුන් පදනම කවරේද;

(iv) එම කැසට් පට ලබා ගැනීම වෙනුවෙන් කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් ජාතික රූපවාහිනිය වෙත ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දෙන ලෙස ඉල්ලීමක් කළේ නම්, එම ඉල්ලීම් කළ අයගේ විස්තර කවරේද;

(ii) එකී ඉල්ලුම් ලිපිය කුමක්ද;

(iii) ජාතික රූපවාහිනිය විසින් එකී කැසට් පට හෝ දෘඪ තැටි නිදහස් කිරීමට බලය ලබා දුන් නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1833/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය රජයේ පාසල්වල දුෂ්කර සේවා කාලය අවසන් වීමෙන් පසු මාරුවීම් නොලැබ දැඩි කලකිරීමට පත් ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් සිටින බවත්;

(ii) එසේ කලකිරීමට පත්වීම එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය පිරිහීමට හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට මාතර දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු වීම් ඉල්ලා සිටින දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් නියමිත සුදුසුකම් සපුරා ඇති ගුරුවරුන්ට ස්ථාන මාරු ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1934/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබා ඇති ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ලාභය හෝ අලාභය ලැබීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේ අවස්ථාවේ සිට ඒවා අවසන් වශයෙන් භාවිතාකිරීම දක්වා ඒ මත පැනවෙන සියලුම බදු සහ ගාස්තු එකතුකිරීමෙන් පසු ලැබෙන සමස්ත ලාභය හෝ අලාභය කවරේද;

(ii) බදු එකතු කර ඛනිජ තෙල් නිෂ්පාදන විකිණීම මගින් රජය විසින් මෙතරම් විශාල අසාධාරණ ලාභයක් උපයා ගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) හෙජින් වංචාව හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මේ වන විට විදේශීය බැංකුවලට ගෙවීමට සිදුවී ඇති මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2123/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමේ ආයෝජනය කර ඇති මුදල කොපමණද;

(ii) එකී මුදල් ආයෝජනය කළ වර්ෂයන් කවරේද;

(iii) එකී ආයෝජනයන් සඳහා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iv) එම මුදල් අයෝජනය කිරීමට තීරණය කළ අය කවුරුන්ද;

(v) ඒ සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමතිය ලබා ගෙන තිබේද;

(vi) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1834/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි, කුරුවිට පොලිස් ස්ථානයේ අලුතින් ඉදිකරන ලද දෙමහල් ගොඩනැගිල්ලේ වැඩ අවසන් වී වර්ෂ හතරක් ගතවී ඇතත් ප්‍රයෝජනයට නොගෙන වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඉදිකිරීම් අවසන්ව තිබියදීත් එම නව ගොඩනැගිල්ල විවෘත නොකිරීමට හේතු කවරේද;

(iii) එම නව ගොඩනැගිල්ලේ කුරුවිට පොලිසියේ රාජකාරී කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1935/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ මැයි සිට ජූලි දක්වා වන කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවට බාල තත්ත්වයේ පෙට්‍රල් සහ වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදන සැපයූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(ii) අමාත්‍යාංශය බාල තත්ත්වයේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේදී සිදුවී ඇති වංචාවලින් බැහැර වන්නේ කෙසේද;

(iii) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීම නිසා අලාභහානි විඳීමට සිදු වූ පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීමෙන් ඇති වූ අලාභ හානි සම්බන්ධව පැමිණිලි කළ පාරිභෝගිකයන්ගේ නම් කවරේද;

(v) අලාභ හානි විඳීමට සිදු වූ එක් එක් පාරිභෝගිකයාට වන්දි වශයෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(vi) තත්ත්වයෙන් බාල පෙට්‍රල් හේතුවෙන් හානි වූ යන්ත්‍රෝපකරණ සහිත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(vii) එම ඉන්ධන පිරවුම්හල්වලට වන්දි ලබාදෙන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තත්ත්වයෙන් බාල පෙට්‍රල් පිළිබඳ වංචාව ජනතාවට හෙළිකළ පාර්ශ්වයන් වෙත ආකර්ෂණීය ප්‍රසාද දීමනාවක් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2124/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහා බ්‍රිතාන්‍යය විසින් ලබා දුන් යකඩ පාලම් ව්‍යාපෘතිය යටතේ ලංකාව පුරා ඉදි කළ යකඩ පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) එම පාලම් ඉදිකිරීම සඳහා බ්‍රිතාන්‍යය ලබා දුන් මුදල කොපමණද;

(iv) එම එක් එක් පාලමේ දිග, පළල, ඇස්තමේන්තුගත මුදල සහ ඉදිකිරීම් පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එක් එක් පාලම සඳහා ඇස්තමේන්තුගත මුදලට වඩා වියදම් වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඇස්තමේන්තුගත මුදලට වඩා වියදම් ඉක්මවා යාමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1383/'11

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009, 2010 සහ 2011 යන වර්ෂවලදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය,

(i) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) ශේෂ පත්‍ර සමඟ අවසාන ගිණුම් වාර්තා කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවල මුදල් ප්‍රවාහය කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වත්කම් කවරේද;

(iii) ක්‍රීඩාංගන සහ අනෙකුත් කරුණු සඳහා දරන ලද රුපියල් මිලියනය ඉක්මවූ සමස්ත පිරිවැය කවරේද;

(iv) ඉහත සඳහන් පිරිවැය යෙදවූ ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ස්ථිර සහ තාවකාලික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2010 වර්ෂය සහ 2011 වර්ෂයේ මේ දක්වා වූ කාලය තුළ එම කාර්ය මණ්ඩලයට සිදු කළ ගෙවීම් වෙනුවෙන් වැය කළ සමස්ත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1643/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි බදුරාවල රජයේ පාසල වසා දමා ඇති බවත්;

(ii) මේ වන විට එම පාසලට අයත් රුපියල් ලක්ෂ ගණනාවක් වටිනා ගොඩනැගිලි දිරාපත් වෙමින් පවතින බවත්;

(iii) ප්‍රදේශයේ දරුදැරියන් සඳහා නැවත පාසල විවෘතකර දෙන මෙන් ප්‍රදේශවාසීන් ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල නැවත විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම පාසල විවෘත නොකරන්නේ නම්, වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

(iii) එම පාසල යොදා ගැනීමට අපේක්ෂිත ආර්ථික කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1987/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂය වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබූ සියලුම විශ්වවිද්‍යාල සහ ඒවාට අයත් ආයතනවලට ආරක්ෂක සේවාවන් සැපයීමේ කාර්යය පවරා තිබූ පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම් ආයතන කවරේද;

(ii) ඉහත එක් එක් ආරක්ෂක ආයතන විසින් ආරක්ෂාව සපයනු ලබන විශ්වවිද්‍යාල සහ ඒවාට අයත් ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2010 වර්ෂය වනවිට එක් එක් විශ්වවිද්‍යාලයෙහි සේවයේ යොදවා සිටි ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව සහ මේ වන විට යොදවා ඇති ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් ආරක්ෂක නිලධාරියෙකු සඳහා 2010 වර්ෂයේදී ගෙවන ලද මුදලත් මේ වනවිට ගෙවන මුදලත් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත එක් එක් ආයතනය විසින් මාසිකව ආරක්ෂාව සඳහා වැයකරන මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1835/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 - 2012 අධ්‍යයන වර්ෂය සඳහා රජයේ විශ්වවිද්‍යාලවලට තෝරා ගන්නා ලද ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි පාඨමාලා පැවැත්වීමට කටයුතු කර ඇති බවත්;

(ii) ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් විසි දෙදෙනෙකු පුහුණු කර ඇති බවත්;

(iii) එම නිලධාරීන් නොසලකා හැර නුපුහුණු නිලධාරීන් යොදා ගෙන මෙම පාඨමාලාවන් පවත්වාගෙන යන බවත්;

(iv) ඒ හේතුවෙන් එම පාඨමාලාවල ගුණාත්මකභාවය හීන වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාලවල ඉහත සඳහන් පාඨමාලා පැවැත්වීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) එම අරමුදල් වියදම් කරන ක්‍රමවේද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1936/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ සිට මාතර දක්වා වන දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහා සකස් කළ මූලික සැලැස්ම කවරේද;

(ii) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කළ වියදම සංශෝධනය කළ ආකාරය කවරේද;

(iii) එම සංශෝධන සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මාතර - කොළඹ දක්ෂිණ අධිවේගී මාර්ගය හම්බන්තොට දක්වා දීර්ඝ කිරීමට අදහස් කරන්නේද;

(ii) එසේ නම්, එම දීර්ඝ කිරීම සඳහා ඇස්තමේන්තු කළ වියදම කොපමණද;

(iii) ඒ සඳහා අවශ්‍ය මුදල් සපයා ගන්නා ආකාරය කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ කවරේද;

(v) එම ඉදිකිරීම සිදුකිරීමට නියමිත කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2125/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කල්මුනේ හා වවලකඩේ මාර්ගයේ පිහිටා ඇති කිත්තංගි පාලම ඉදිකිරීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එකී ඉදිකිරීම් ආරම්භ කළ යුතුව තිබූ දිනය හා අවසන් කළ යුතුව තිබූ දිනය කවරේද;

(iv) මේ වන විට එකී ඉදිකිරීම් අවසන් කර තිබේද;

(v) අවසන් කළ යුතුව තිබූ දිනට අවසන් නොකළේ නම්, ඒ සඳහා ප්‍රමාද ගාස්තු අය කරගෙන තිබේද;

(vi) එසේ නම්, එම මුදල කොපමණද;

(vii) එකී ඉදිකිරීම් කළ සමාගමේ නම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1836/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල තේ සහ රබර් වතු ආශ්‍රිතව ජීවත් වන ජනතාවගෙන් බහුතරයකට උප්පැන්න සහතික නොමැති බවත්;

(ii) එම නිසාම ජාතික හැඳුනුම්පත් ලබාගැනීමට නොහැකිවී ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් මැතිවරණ ලේඛනවල නම ඇතුළත් නොවීමෙන් ඡන්ද බලය පවා අහිමිව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශයන්හි ජීවත්වන උප්පැන්න සහතික නොමැති අයට ඒවා ලබා දීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත දිස්ත්‍රික්කයන්හි ද්‍රවිඩ ජනතාව ජීවත් වන ප්‍රදේශ සමග සිංහල ජනතාව නියෝජනය කරන ග්‍රාම නිලධාරී කොට්ඨාස ඒකාබද්ධ කිරීම නිසා රාජකාරී ඉටුකර ගැනීමේදී ජනතාවට භාෂාව පිළිබඳ ගැටලු මතුවී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය මගහරවා ගැනීම සඳහා තම භාෂාවෙන් රාජකාරී ඉටුකර ගැනීමට හැකි වන පරිදි ග්‍රාම නිලධාරීන් පත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

1937/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ, වර්ෂ 42ක් පැරණි තෙල් පිරිපහදුව දැන් යල්පැන ගොස් ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව පුළුල් කිරීම සඳහා ඉරාන රජයෙන් ලබාදීමට පොරොන්දු වූ ණය මුදල ලැබී තිබේද;

(ii) එසේ නම්, එය ලැබුණු දිනය කවරේද;

(iii) ඊට රජයෙන් සැපයෙන අරමුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ඉදිකිරීමට අදහස් කර ඇති පිරිපහදුවේ අපේක්ෂිත නිෂ්පාදන ධාරිතාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දිනකට බොරතෙල් බැරල් 100,000ක් පිරිපහදු කිරීම, පිරිපහදුවේ දැනට පවතින ධාරිතාව දෙගුණවීමක්ද;

(ii) පිරිපහදුව පුළුල් කිරීම සඳහා ඉරානය විසින් ලබාදී ඇත්තේ ණය මුදලින් 1/3ක් පමණක්ද;

(iii) ණය මුදලින් 1/3ක වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 1.5ක් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොකඩවා පිටතින් තෙල් මිලදීගැනීම හරහා පෞද්ගලික වාසි ලබාගැනීමේ අරමුණින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇතැම් පාර්ශ්වයන් විසින් තෙල් පිරිපහදුව පුළුල් කිරීමට බාධා පමුණුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2126/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමට හැර අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබා දී ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන ලබා දුන් දිනයන් කවරේද;

(iii) ලබා දුන් එම වාහනවල අංක සහ වර්ගයන් කවරේද;

(iv) එම වාහන ලබා දීමට හේතු කවරේද;

(v) මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ආපසු ලබාගත් වාහන කවරේද;

(vi) එසේ ආපසු ලබා ගත් වාහන වල තත්ත්වය පිළිබඳව විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1387/'11

ගරු රවී කරුණානායක මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල එක් වර්ග අඩියක් සඳහා වන මිල කොපමණද; සහ

(iii) එම ගොඩනැගිලි බද්දට ගත් කාල සීමාව කවරේද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයට අදාළ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යාංශයට අයත් වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) පිටතින් ලබා ගන්නා අනෙකුත් සේවාවන් කවරේද;

(iv) ඉහත සඳහන් කරන ලද පිටතින් ලබා ගන්නා සේවා සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) පිටතින් සේවය ලබා ගැනීමේ පදනම මත සේවය ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(vi) කාර්ය මණ්ඩලයේ සිටින මුළු සාමාජිකයන් සංඛ්‍යාව කවරේද;

යන්නත් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අදාළව ඉහත සඳහන් වර්ෂ සඳහා, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1644/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ පිහිටි නාගොඩ ආනන්ද කණිෂ්ඨ විද්‍යාලය වැසී ගොස් වර්ෂ හයක් පමණ ගතවී ඇති බවත්;

(ii) මේ වන විට, පාසල සතු සියලු ගොඩනැගිලි වල් බිහි වී, දිරාපත් වෙමින් පවතින බවත්;

(iii) නගරයේ පවතින ජනප්‍රිය පාසල්වල තදබදය අඩු කිරීම සඳහා මෙම පාසල නැවත විවෘත කරන ලෙස ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල නැවත විවෘත කරන්නේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

(ii) නොඑසේ නම්, පාසලේ සම්පත් වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ආර්ථික කටයුත්ත කවරේද;

(iv) එම ආර්ථික කටයුත්ත ආරම්භ කිරීම සඳහා ගතවන කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2009/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, රන්මිහිතැන්න සිනමා ගම්මානය ඉදිකර ඇති භූමියේ අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එය විවෘත කරන ලද දිනය කවරේද;

(iii) විවෘත කළ දින සිට අද දක්වා එම සිනමා ගම්මානය සිනමාපට සහ ටෙලි නාට්‍ය රූපගත කිරීමට භාවිතා කරන ලද එක් එක් අවස්ථාවේදී එම ආයතනය වෙත ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රන්මිහිතැන්න සිනමා ගම්මානයේ රූ ගත කරන ලද ටෙලි නාට්‍ය හෝ සිනමාපට කවරේද;

(ii) එම එක් එක් නිර්මාණයේ අධ්‍යක්ෂ, නිෂ්පාදක හෝ නිෂ්පාදනයට සම්බන්ධවූ සමාගම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1837/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ, හොරගොඩ - නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටි භාග්‍යාගම නම් වූ උදාගමේ පදිංචිකරුවන්ට එම ඉඩම් මැන, මායිම් ගල් යොදා, ඉඩම් බලපත්‍ර ද සමග ඉඩම් බෙදා දුන් බවත්;

(ii) පසුව එම ඉඩම්වල අයිතිය තමන් සතු බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව විසින් සඳහන් කර ඇති බවත්;

(iii) ඒ අනුව, එම ඉඩම් නැවත මැන බලපත්‍ර ලබා දීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව විසින් පදිංචිකරුවන්ගෙන් මුදල් ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ඉඩම් නැවත මැන බලපත්‍ර ලබාදීම සඳහා මුදල් ඉල්ලා සිටීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ඉඩම් නැවත මනිනු ලබන්නේ නම්, එම දිනය කවරේද;

(ii) ඉදිරියේදී එම ඉඩම්වලට අදාළව සින්නක්කර ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එම ඉඩම් සඳහා පදිංචිකරුවන්ගෙන් මුදල් අයකිරීමේ සැලසුමක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2127/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කොළඹ - නුවර ප්‍රධාන මාර්ගය පුළුල් කළ දුර ප්‍රමාණය කොපමණද;

(ii) එම මාර්ග පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කළ වර්ෂය සහ නිම කළ වර්ෂය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(iv) එම මාර්ගය ඉදිකිරීමේ ඇස්තමේන්තුව ඉක්මවා මුදල් වියදම් කර තිබේද;

(v) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග පුළුල් කිරීමේ කටයුතු සඳහා උප කොන්ත්‍රාත් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම උප කොන්ත්‍රාත් ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් ක්‍රමය අනුගමනය කළේද;

(iii) ටෙන්ඩර් කැඳවූයේ නම්, ඒ සඳහා ඉල්ලුම් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ටෙන්ඩරය ලබා දුන් අයගේ හෝ ආයතනයේ නම, ලිපිනය සහ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2143/’11

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා මුදල් යෙදවීමට රජයට අරමුදල් ලබා දුන් පෞද්ගලික අංශයේ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) ඉහත කී ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට සහයෝගය ලබා ගැනීම සඳහා මෙරටට ගෙන්වා ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට සහයෝගය ඉල්ලා සිටීම සඳහා විදේශ ගතවූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ වෙනුවෙන් දරන ලද මුළු පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2011 නොවැම්බර් මාසයේ සෙන්ට් කිට්ස් නගරයට ගිය පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ගිය පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) එහි යාමට සහ ආපසු ඒමට දැරූ මුළු වියදම කොපමණද;

(iv) එම කණ්ඩායම සඳහා ලබාගත් කුලී ගුවන් යානා සඳහා දැරූ වියදම කොපමණද;

(v) ජයග්‍රහණය පිළිබඳ එපමණ විශ්වාසය තබා තිබියදී ශ්‍රී ලංකාවට පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල සඳහා සත්කාරක රට ලෙස කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වූයේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1838/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වරකාපොල, අඹේපුස්ස, දේවාල පාර, අංක 11 හි පදිංචි ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ඩී. බී. ඇල්කඩුව මහතාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ චෝදනා සම්බන්ධයෙන් 2009.10.09 වැනි දින හා 2011.02.08 වැනි දින කට උත්තර ලබාගෙන ඇති බවත්;

(ii) ඇල්කඩුව මහතාට දිගින් දිගටම හිරිහැර කිරීම නිසා ඔහු දැඩි ආර්ථික හා මානසික පීඩනයකට පත්ව සිටින බවත්;

(iii) නිදහස් මාධ්‍ය භාවිතයට ඉඩ ලබාදෙන ලෙස ඒ මහතා විසින් වගකිව යුතු නිලධාරීන්ගෙන් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඇල්කඩුව මහතාගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

(ii) ඒ මහතාට මුහුණදීමට සිදුවූ අපහසුතාවයන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2128/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා පඩුවස්නුවර මැතිවරණ කොට්ඨාසය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට, පළාත් සභාවට සහ ප්‍රාදේශීය සභාවට අයත් රජයේ ප්‍රතිපාදන යටතේ හෝ විදේශ ආධාර මත ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් මාර්ගය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම එක් එක් මාර්ගයේ දුර ප්‍රමාණය, පළල සහ ප්‍රතිසංස්කරණය කළ තත්ත්වය (තාර, කොන්ක්‍රීට්, කොන්ක්‍රීට් කැට) කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග ප්‍රතිසංස්කරණයට අදාළව ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ටෙන්ඩර් කැඳවූයේ නම්, එක් එක් මාර්ගය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ටෙන්ඩර් ලබාදුන් අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත එක් එක් මාර්ග ප්‍රතිසංස්කරණය අවසානයේ වැයවී ඇති මුදල කොපමණද;

(ii) එම මාර්ග ප්‍රතිසංස්කරණයන් නිම කිරීමෙන් පසු කොන්ත්‍රාත්තු ලබා දුන් ආයතන විසින් තාක්ෂණික වාර්තා ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම වාර්තා සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2144/'11

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැදිරිගිරිය ජාතික පාසලේ මහා පරිමාණ දූෂණ ක්‍රියා දිගින් දිගටම සිදුවෙමින් පවතින බවත්;

(ii) ඉහත කී පාසලේ සිදුවී ඇති අරමුදල් අයුතු ලෙස පරිහරණය කිරීම් සිද්ධි කිහිපයක් ජනාධිපති විමර්ශන ඒකකය විසින් හෙළි කරගෙන තිබෙන බවත්;

(iii) අදාළ ඇතැම් අයථා ක්‍රියා පිළිබඳව පුවත්පත්වල වාර්තාකර තිබූ බවත්;

(iv) මෙම පාසලේ විදුහල්පතිවරයා පාසල දියුණු කිරීම නොසලකා හැර, වංචා සහගත ලෙස මුදල් උපයා ගැනීමේ අරමුණින් පමණක් කටයුතු කරමින් සිටින බවත්;

(v) එම විදුහල්පතිවරයා, ඔහු විසින් සිදුකරනු ලබන අයථා ක්‍රියාවලට විරුද්ධවන අවංක ගුරුවරුන් පීඩාවට පත්කරන බවත්;

(vi) එවැනි විදුහල්පතිවරුන් මෙරටේ තරුණ පරපුර විනාශ කරන බැවින් ඔවුන් ශ්‍රී ලංකාවට උවදුරක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලුකාරී තත්ත්වයන් නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 අගෝස්තු මස 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1389/'11

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල එක් වර්ග අඩියක් සඳහා වන මිල කොපමණද;

(iii) එම ගොඩනැගිලි බද්දට ගත් කාල සීමාව කවරේද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයට අදාළ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ගැනීම සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යාංශයට අයත් වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) පිටතින් ලබා ගන්නා ඇනෙකුත් සේවාවන් කවරේද;

(iv) ඉහත සඳහන් කරන ලද පිටතින් ලබා ගන්නා සේවා සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) පිටතින් සේවය ලබා ගැනීමේ පදනම මත සේවය ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(vi) කාර්ය මණ්ඩලයේ සිටින මුළු සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළව ඉහත සඳහන් වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1645/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රදේශයේ පිහිටි බෙලිඅත්ත පොදු වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා වර්ෂ ගණනාවක් ගත වී ඇති බවත්;

(ii) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීමෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව තම ගොවි නිෂ්පාදන අලෙවි කර ගැනීමේදී ගැටලු රාශියකට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2020/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේදී පවත්වන ලද බන්ධනාගාර ජේලර් - දෙවැනි පංතිය සහ සුබසාධක නිලධාරී - දෙවැනි පංතිය තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුරු සඳහා වන පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එකී පුරප්පාඩු සඳහා උක්ත තරග විභාගයේ ප්‍රතිඵල මත මේ වන විට බඳවා ගැනීම් සිදුකර තිබේද;

(iv) එසේ නම්, බඳවා ගත් අවම ලකුණු සීමාව කවරේද;

(v) ඉහත පරිදි බඳවාගත් අයගේ නම්, ලිපිනයන් සහ ලබාගත් ලකුණු ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එකී තරග විභාගයේ ප්‍රතිඵල පදනමට අමතරව වෙනත් පිරිස් බඳවා ගෙන තිබේ නම්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vii) එසේ බඳවා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1839/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රදේශයේ පිහිටා ඇති හෙල්වැල්ල පවුල් සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දිරාපත් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා ඉටුකර දීමට හැකිවන පරිදි එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කරදීමට කඩිනමින් කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට මේ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2129/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ එක් දිසාවකට ඇති මංතීරු ගණන කොපමණද;

(ii) එම එක් මංතීරුවක පළල කොපමණද;

(iii) අධිවේගී මාර්ගයක මංතීරුවක් සඳහා ජාත්‍යන්තරව පිළිගත් පළල කොපමණද;

(iv) සේවා සැපයීම සඳහා වෙන් කර ඇති මංතීරුවේ පළල කොපමණද;

(v) ඒ සඳහා ජාත්‍යන්තරව පිළිගත් පළල කොපමණද;

(vi) ඉහත මංතීරුවල පළල ජාත්‍යන්තර ප්‍රමිතියට වඩා අඩු වී තිබේද;

(vii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2183/'11

ගරු රවී කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ඉඩම් හිමිකම් අංශය විසින් දැනට පවතින හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති දුර්වලතා රාශියක් සොයාගෙන ඇති බවත්;

(ii) ඉහත කී පනත සංශෝධනය කළ යුතු බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ද නිර්දේශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) සහ (ii) අනුව හිමිකම් ලියාපදිංචිකිරීමේ පනත සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති දුර්වලතා සහ යෝජිත සංශෝධන කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) පාර්ලිමේන්තුව මගින් එම සංශෝධන සඳහා මේ වනවිට අනුගමනය කරමින් පවතින ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) දුර්වලතා රාශියක් පැවතියද, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත දැඩිව ක්‍රියාත්මක කරමින් සිටින බවත්;

(ii) අදාළ අමාත්‍යාංශය විසින්, එම හඳුනාගත් දුර්වලතා වෙනස් නොකර, ඉහත කී පනතට නව වගන්ති 105ක් ඇතුළු කිරීමට උත්සාහ දරමින් සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1840/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මුල්ගිරිගල ප්‍රදේශයේ වලස්මුල්ල නව වෙළඳ සංකීර්ණය විවෘත කර වර්ෂ එකහමාරක් ගතවී ඇතත්, මේ දක්වා ඉන් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ඇති බවත්;

(ii) නව වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිසි ප්‍රමිතියෙන් තොරව සිදුකර ඇති බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) එම අරමුදල් සපයා ගනු ලැබුවේ දේශීයව ද; නැතහොත් විදේශීය මූලාශ්‍රවලින්ද ;

(iii) අරමුදල් සපයන ලද ආයතනය හෝ ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වලස්මුල්ල නව වෙළඳ සංකීර්ණය නිසි ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(ii) ජනතාවට ප්‍රයෝජනයට ගැනීමට හැකිවන පරිදි වෙළඳ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2130/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ සම්බන්ධීකාරකයන් ලෙස සේවය කළ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී සම්බන්ධීකාරකයින්ගේ නම් සහ ඔවුන් අනුයුක්තකර ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම තනතුර ලබා දී ඇති කාල සීමාව කවරේද;

(iv) ඔවුන්ගේ මාසික වැටුප සහ අනෙකුත් දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2184/'11

ගරු රවි කරුණානායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල්කිස්ස දිස්ත්‍රික් අධිකරණ සංකීර්ණයේ මහජනයාගේ ප්‍රයෝජනය පිණිස සවිකර ඇති විදුලි සෝපානය ක්‍රියාත්මක තත්ත්වයක පවතින්නේද;

(ii) නොඑසේ නම්, එය ක්‍රියා විරහිත වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් විදුලි සෝපානය සවිකිරීම සඳහා ඇස්තමේන්තු කළ වියදම කොපමණද;

(ii) විදුලි සෝපානය සවිකළ ඉංජිනේරුවන්ගේ නම් කවරේද;

(iii) විදුලි සෝපානය සවි කිරීම ඔවුන් නිසි පරිදි සිදුකර තිබේද;

(iv) මෙම විදුලි සෝපානය සම්බන්ධයෙන් වෙනත් ගැටලු පැනනැගී තිබේද;

(v) එසේ නම්, හඳුනාගෙන ඇති ප්‍රධානතම ගැටලුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම විදුලි සෝපානය සහ එය භාවිතාකිරීම පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ගල්කිස්ස නීතිඥ සංගමය විසින් අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) එම ඉල්ලීම්වලින් පෙන්වාදී ඇති ගැටලු විසඳීම පිණිස දැනටමත් ගෙන ඇති සහ ඉදිරියට ගැනීමට නියමිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?